# බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**(බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස සහ ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය)**

## මිහිලක් එළවළු සහ පළතුරු වලින් අගය එකතු කල සහ මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘති තනතුරු සඳහා ඇබෑර්තු

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වල්පිට, මිහිලක් එළවළු සහ පළතුරු වලින් අගය එකතු කල නිෂ්පාදන, මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘති සඳහා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් කාර්ය පැවරුම් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### තනතුරු

**1. නිෂ්පාදන කළමනාකරු -** එළවළු සහ පළතුරු වලින් අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘතිය

**සුදුසුකම්:**

**අධ්‍යාපන හා පළපුරුද්ද**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආහාර විද්‍යාව සහ තාක්ෂණය හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම.

(ii) උපාධිය ලබා ගැනීමෙන් පසු අවුරුදු 01කට නොඅඩු කාලයක් ආහාර නිෂ්පාදනය හෝ තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**2. නිෂ්පාදන කළමනාකරු -** මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘතිය

**අධ්‍යාපන හා පළපුරුද්ද**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආහාර විද්‍යාව සහ තාක්ෂණය හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම. සත්ව නිෂ්පාදන සහ පෝෂණය පිළිබඳව විශේෂ උපාධියක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

(ii) උපාධිය ලබා ගැනීමෙන් පසු අවුරුදු 01කට නොඅඩු කාලයක් ආහාර නිෂ්පාදනය හෝ තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**3. තත්ව කළමනාකරු -** එළවළු සහ පළතුරු වලින් අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘතිය

**අධ්‍යාපන හා පළපුරුද්ද**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණය හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම.

(ii) උපාධිය ලබා ගැනීමෙන් පසු අවුරුදු 01කට නොඅඩු කාලයක් ආහාර නිෂ්පාදනය හෝ තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**4. තත්ව කළමනාකරු -** මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘතිය

**අධ්‍යාපන හා පළපුරුද්ද**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණය හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම. සත්ව හෝ ජල ජීවී නිෂ්පාදන සහ පෝෂණය පිළිබඳව විශේෂ උපාධියක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

(ii) උපාධිය ලබා ගැනීමෙන් පසු අවුරුදු 01කට නොඅඩු කාලයක් ආහාර නිෂ්පාදනය හෝ තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**5. නඩත්තු කාර්මික ශිල්පී -** එළවළු සහ පළතුරු වලින් අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘතිය සහ මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කල නිෂ්පාදන ව්‍යාපෘතිය

**අධ්‍යාපන හා පළපුරුද්ද**

(i) තෘතීය සහ වෘත්තීය කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව හෝ යන්ත්‍ර නඩත්තු, සේවා සහ අලුත්වැඩියාව පිළිබඳ වෘත්තීය කුසලතා (NVQ) පස්වන (05) මට්ටමට නොඅඩු ඩිප්ලෝමා සහතියක් ලබා තිබීම.

(ii) ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමෙන් පසු අවුරුදු 01කට නොඅඩු කාලයක් ආහාර නිෂ්පාදනය හෝ තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**වයස :**

(i) වයස අවුරුදු 22ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප:**

1,2,3 සහ 4 යන කළමනාකාර තනතුරු සඳහා මාසික දීමනාව රු.43,355.00 සහ රජය විසින් අනුමත වෙනත් දීමනාවන් ගෙවනු ලැබේ.

නඩත්තු කාර්මික ශිල්පී තනතුර සඳහා මාසික දීමනාව රු.30,310.00 සහ රජය විසින් අනුමත වෙනත් දීමනාවන් ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි:**

01. මෙම තනතුරු කාර්ය පැවරුම් පදනමකින් යුතු අතර, විශ්‍රාම වැටුප් රහිතය.
02. ඉල්ලුම්පත්‍ර කැඳවන අවසාන දිනයට ආසන්න වසර 03 තුල බස්නාහිර පළාතේ පදිංචිකරුවන් හෝ ගම්පහ දිස්ත්‍රික්කය හෝ ඊට ආසන්න දිස්ත්‍රික්කයක පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.
03. මෙම තනතුරට සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලේ දයකත්වය හිමිය.
04. බඳවාගනු ලබන අය බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්පිට ග්‍රාම සේවා වසමේ පිහිටි ව්‍යාපෘති හි සේවය සඳහා සුදානම්ව සිටිය යුතු අතර, ගමන් වියදම් හෝ නැවතීමේ පහසුකම් සපයා දෙනු නොලැබේ.

සියළුම අයදුම්පත් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ වයස, පදිංචි ස්ථානය පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක, කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප.) නො.4ඒ,1/1, සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලැබෙන සේ 2022.11.26 දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් idawp@sltnet.lk එවිය යුතුය. අයදුම් පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප.)**